# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2026 අංක 4 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2026 පෙබරවාරි මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2026 පෙබරවාරි මස 27 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 20.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2026 අංක 4 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2026 පෙබරවාරි මස 17 වන දින]

එල්.ඩී. - ඕ 62/2023

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත සංශෝධනය කිරීම පිණිස ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2026 අංක 4 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනතේ දීර්ඝ නාමය, **''නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට''** යන වචන වෙනුවට **''නැව් බඩු ගෙනයන්නන්ට සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට''** යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1972 අංක 10 දරන පනතෙහි දීර්ඝ නාමය සංශෝධනය කිරීම

PL 15623 - 768(2026/01)

නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත සහ නැව් නියෝජිතයන්,නැව් බඩු ගෙනයන්නන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන් යන්න පිළිවෙලින්, නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට බලපත්‍ර ලබා දීමේ පනත සහ නැව් නියෝජිතයන්, නැව් බඩු ගෙනයන්නන් සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බව

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක -

(අ) ‘‘නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත’’ යන වචන වෙනුවට ‘‘නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට බලපත්‍ර ලබා දීමේ පනත’’ යන වචන; සහ

(ආ) ‘‘නැව් නියෝජිතයන්, නැව් බඩු ගෙනයන්නන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්’’ යන වචන වෙනුවට ‘‘නැව් නියෝජිතයන්, නැව් බඩු ගෙනයන්නන් සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්’’ යන වචන,

ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක, ‘‘නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත’’ පිළිබඳව වන සෑම සඳහන් කිරීමක් ම, ‘‘නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට බලපත්‍ර ලබාදීමේ පනත’’ පිළිබඳ සඳහන් කිරීමක් වශයෙන් කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ ‘‘කන්ටේනර් මෙහෙයුම්කරුවන්’’ යන යෙදුමෙහි අර්ථ නිරූපණය ඉවත් කිරීම මඟින් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ව්‍යාවර්තන සහ අන්තර්කාලීන විධිවිධාන

**5.** වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක කුමක් සඳහන් ව තිබුණ ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට -

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1අ) උපවගන්තිය යටතේ කන්ටේනර් මෙහෙයුම්කරුවකු සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පොරොත්තුව තිබෙන යම් ඉල්ලුම් කිරීමක්, 2026 අංක 3 දරන කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ විධිවිධාන යටතේ සිදු කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට නිශ්චිතව අත්හිටුවනු ලැබ ඇත්නම් හෝ අවලංගු කර ඇත්නම් මිස, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින හෝ බලපැවැත්වෙන කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට නිකුත් කරන ලද සියලු බලපත්‍ර, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි 2026 අංක 3 දරන කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද බලපත්‍ර වශයෙන් සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.